


# ආධිපත්‍ය දැරීමේදී පිරිමින් ඉදිරියෙන්

**ආධිපත්‍ය, අභිමානය, කීර්තිය, සහ බලපුලුවන්කාරකම කෙරෙහි ගැහැනියක මෙන් නොව පිරිමියකු තුළින් නිසගයෙන්ම ජනිතවන ආශාවන් අභිලාෂයන් ගැන අනාගත ඉලක්කයන් බෙහෙවින් ආක්‍රමණශීලි ප්‍රවණතාවක් පිළිඹිඹු කරති.**

මිනිසා ආධිපත්‍යහි තුළ වැජඹීමට දරණ ප්‍රයත්නය ඔහුගේ හැඟීම්, වර්ණය සහ සමීප මිත්‍ර සම්බන්ධතා වෙනසකට භාජනය කිරීමට සමත්වන අතර එමගින් අපගේ ඉරියව් යම් පරිවර්තනයකට පත් කරනු ලබයි. අවසානයේදී මේ සියල්ලම අපගේ සෞඛ්‍යයට බෙහෙවින් බලපෑම් සිදුකරයි. නමුත් එය එතරම් අහිතකර නොවේ

ඉතිහාසය දෙස හරි බලන්නෙකුට දහතුන්වන සියවසේ ජීවත්වූ ජෙංගිස්ඛාන් කදිම උදහරණයක් ලෙස සැළකිය හැකිය.බලය සහ ගැහැනිය ඔහුගේ ප්‍රමුඛත්වයන් විය. සතුරන් ජයගෙන ඔවුන් සතුව වස්තුව කොල්ලකෑම මිනිසකු මිහිපිට ලබන උසස්ම තෘප්තිය බව ඔහු වරක් ප්‍රකාශ කළේය.

දහතුන්වන සියවසේ මුල් භාගය වනවිට නැගෙනහිර යුරෝපයේ සිට කොරියාව දක්වා මහා අධිරාජ්‍යයක් ගොඩනැගූ ජෙංගිස්ඛාන් ඉතිහාසයේ නව පිටුවක් පෙරලීමට සමත්විය.

ජීව විද්‍යාඥයින් විසින් හඳුවන්වනු ලබන "ප්‍රජනන ක්‍රියාවලිය" විෂයයෙහි ලා ජෙංගිස්ඛාන් තබා ඇති වාර්තාව මෙතෙක් කිසිවෙකු බිඳහෙලා ඇද්දැයි යන්න සැක සහිතය. ඔහුගේ මරණින් වසර 33 කට පසු ලියැවුන ග්‍රන්ථයක සඳහන්ව ඇත්තේ ඔහුගෙන් පැවත එන සංඛ්‍යාව 20,000 කට අධික බවකි. වෙනත් වචනවලින් කිවහොත් ස්වකීය අධිරාජ්‍යයේ වැසියන්ගෙන් 8% කට ජෙංගිස්ඛාන්ගේ ජාන මුහුවී ඇතැයි වර්තමානයේ පර්යේෂකයෝ විශ්වාස කරති.

ඔහුගේ යුගයෙන් පසු පිරිමි වර්ගයාගේ ගති ස්වභාවයන් කැපී පෙනෙන ආකාරයෙන් වර්ධනය වී තිබේ. කාලයාගේ ඇවෑමත් සමගම රජවරුන් විසින් පවත්වා ගෙන ගිය අන්තඃපුර පවා යුගයට නොගැලපෙන්නක්සේ අහෝසි වී ගොස් ඇත. අනුන් සතු වස්තුව සංවිධානාත්මක අයුරින් කොල්ල කෑම සහ ආක්‍රමණය ඒකාධිපතින් වෙතින් ගිලිහී ගොස් තිබේ. එහෙත් එද සිට එනම් වසර 800 කට පෙර විසූ මිනිසාය අදත් ජීවත්වන්නේ.

මේ තොරතුරු වලින් අර්ථවත් වන්නේ කුමක්ද ? සැබවින්ම මානවයා උසස් පාලන, නිලතල, හා සමාජ තත්ත්වයන් හෝ පෞද්ගලික නීතිය හඹායන්නක් බව නොවේද ? සමානාත්මතාවය සහ සහෝදරත්වය ගැන අප නිතර දේශනා පැවැත්වීමට හුරුවී සිටිමු. එසේම පන්ති භේදයකින් තොර සමාජ සංස්ථාවක් අරමුණු ගොඩ ගෙන අපි අරගලයක යෙදී සිටිමු. මෙම ප්‍රවණතාවන්ගෙන් අපට බැහැර විය හැකිද? නොහැකිවාසේ පෙනේ. මෙලෙස ආධිපත්‍යය හෝ උසස් සමාජ තත්වය වෙත හඹායාම හුදෙක් පුරුද්දක් හෝ සංස්කෘතික සම්ප්‍රදයන් නොවන අතර එය පිරිමි මනස නිර්මාණය වී ඇත. ප්‍රබල ලක්ෂණයක් බව විද්‍යා පර්යේෂණ වලින් හෙළිදරව් වී ඇත. එය ජීව විද්‍යාත්මක බලවේගයක් වන අතර ස්නායු පද්ධතිය තුළ මුල් බැසගෙන ඇති හෝමෝන් සහ මොළයේ අඩංගු රසායනික ද්‍රව්‍යයක් මගින් පාලනය වන බවද විද්‍යාත්මක මතය වී තිබේ.

මිනිසා ආධිපත්‍යහි තුළ වැජඹීමට දරණ ප්‍රයත්නය ඔහුගේ හැඟීම්, වර්ණය සහ සමීප මිත්‍ර සම්බන්ධතා වෙනසකට භාජනය කිරීමට සමත්වන අතර එමගින් අපගේ ඉරියව් යම් පරිවර්තනයකට පත් කරනු ලබයි.

අවසානයේදී මේ සියල්ලම අපගේ සෞඛ්‍යයට බෙහෙවින් බලපෑම් සිදුකරයි. නමුත් එය එතරම් අහිතකර නොවේ.

ආධිපත්‍යය ස්ථාපිතය කිරීමේ දී සමගිය මෙන්ම ගැටුම් හා අසාධාරණයට ද මග පෑදේ.

ආධිපත්‍යය දැරීමේ ලා පිරිමි ගැහැනුන්ට වඩා වැඩි ප්‍රවණතාවක් පෙන්නුම් කරති. 13 මසැති පිරිමි දරුවකු ගැහැනු දරුවකුට වඩා ස්වකීය අවශ්‍යතා මෙන්ම අයිතිවාසිකම් අවධාරණය කිරීමටත්, ඇවිදින වියේදී වඩා පෙරලිකාරී ස්වභාවයකුත්,

ඒ වාගේම පසු ජීවිතයේ සෑම අවස්ථාවකදීම වඩාත් තරඟකාරී බවක් ඉස්මතු කිරීමටත්, පුරුදු වී සිටී. පාසලේදී ගැහැනු ළමුන් සමූහ වශයෙන් ක්‍රීඩාවල නිරත වන අතර, අවුරුදු 6 වැනි අඩු වයසක පිරිමි දරුවකු පවා ස්වකීය ආධිපත්‍යය පිහිටුවාලීමටත් ඒ සඳහා කටෝර පිළිවෙත් අනුගමනය කිරීමටත් පුරුදුව සිටියි.

ගැහැනු ළමුන්ට වඩා තරුණ පිරිමි ළමෝ පුරසාරම් දෙඩීමටත්, පීඩාකාරී ස්වරූපයක් දැරීමටත් සමත් වෙති. වැඩිමහල්ලන් මෝරපු වයසේ දී සමාජ විෂමතා ගැන වැඩි තැකීමක් නොදක්වන අතර, හමුදාමය කටයුතු නගා සිටුවීම කෙරෙහි වැඩිමනාපයක් දක්වන බව නිරීක්ෂණය වී තිබේ. එසේම තම සමීප හිතවතුන් සමග ඉතා කිට්ටුවෙන් අදහස් හුවමාරු කර ගැනීමට පෙළඹෙන්නේද නැත.

**අඩු සමාජීය සහ ආර්ථික මට්ටම හේතු කොටගෙන විවිධ රෝගාබාධ වලට පිරිමින්ට මුහුණ පෑමට සිදුවෙතැයි ස්ටැන්පර්සි හී ජීව විද්‍යාඥ රොබර්ට් සැපෙල්ස්කි පවසයි.සමාජයේ පහත් තලයකට තල්ලුවීම නිසා රුධිර පීඩනය, ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය හීනවීම සහ හදවතට හානි සිදුවියහැකි යයි සතුන් සම්බන්ධයෙන් පවත්වන ලද අධ්‍යයනයකින් හෙළිවී ඇත**

පිරිමින් විසින් පවත්වාගෙන යනු ලබන සමීප සම්බන්ධතා 'මිත්‍ර සන්ධානවල' ස්වරූපයක් ගනී. ඩර්හැම් විශ්වවිද්‍යාලයේ මනෝවිද්‍යාඥ ඇන් කැම්බල් "ඇයගේ මනස" නමැති ග්‍රන්ථයේ දක්වා ඇත්තේ ඔවුහු (පිරිමින්) එකිනෙකාට සහයෝගය දක්වන අතර ඔවුන්ගේ අරමුණු හා ක්‍රියාකාරකම්වලටද අන්‍යොන්‍ය වශයෙන් දායක වෙති. එහෙත් ඒ සැමදෙයක් කල්පනාවෙන් හා අපේක්ෂාකාරීව ඉටු කිරීමට වඩාත් ප්‍රවේසම් වේ.ආධිපත්‍ය දැරීමේ ප්‍රවණතාවය එක් සමාජයකට පමණක් සීමා නොවූවකි. මානව විද්‍යාඥයින් මෙන්ම සත්වවිද්‍යාඥයින්ද එකසේ මෙම සුවිශේෂ ප්‍රවණතාවය ස්වකීය පර්යේෂණ මගින් හෙළිකර තිබේ.ක්‍රිකට් ක්‍රීඩාවේ දී පිරිමින් අතර තරගකාරිත්වය බෙහෙවින් තියුණුය. පොකිරිස්සන්, අලි ඇතුන් සහ උසස් ප්‍රිමාටේස් වර්ගයේ සතුන් අතරද, එබඳුම තරගකාරිත්වයක් පවතී. ආධිපත්‍ය සඳහා පිරිමි චිම්පන්සිහු අති විශේෂ උනන්දුවක් දක්වයි.එමෝරි විශ්ව විද්‍යාලයයේ චයසිාවේද විද්‍යාඥයෙකුවූ ෆ්‍රාන්ස් ඩී වාල් කියයි. ඔවුහු නිරන්තරයෙන්ම ආධිපත්‍ය නොවීම සඳහා සටන් වදිති. චිම්පන්සිහුද පිරිමින් මෙන් බොරුවෙන් රැවටීමට, කපටිකම්වලට සහ සමහර අවස්ථාවල දී තම රැලේ එකකු මරාදැමීමටද පසුබට නොවෙති.

ඔවුහු මිනිසුන් මෙන් ජයග්‍රහණයේ දී සහ පරාදවීමේ දී කායික හා මානසික හැඟීම් තුළින් තම ප්‍රතිචාරය දැක්වීමට පුරුදුව සිටිති.

පිරිමින් සටනකට පාරම්බානවිට එසේත් නැතනම් වෙස් වැනි තරගයකට සූදානම් වන විට ශරීරයේ ක්‍රියාකාරිත්වයට ජවයක් ලබා දෙන කලහාකාරීගතිය උපදවන හෝමෝන් වර්ගයක් වන ටෙස්ටස්ටරෝන් ශරීරය තුළට ගලා එයි. තරගයට මුහුණ දෙන අවස්ථාවල ද ශරීරයේ ටෙස්ටස්ටරෝන් මට්ටම ඉහළ යා හැකියයි හාවඩ් විශ්ව විද්‍යාලයේ මානව විද්‍යාඥ රිචඩ් රැන්හැම් පවසයි. ඉන්පසු ජයග්‍රහණයේ දී ටෙස්ටස්ටොරන් ඉහළ මට්ටමක රැඳී සිටින අතර පරාජයට පත් පුද්ගලයා තුළ එය පිරිහීමට පටන් ගනියි .

පරිණාමවාදීහු මෙයට ඉඳුරාම වෙනස් මතයක එල්බ සිටිති. ජීවිතය අත්‍යවශ්‍යයෙන්ම ප්‍රජනනය සඳහා අරමුණු කරගත් දෙයක් වන අතර, ස්වාභාවික වරනය විසින් ජීවීන්ට විවිධ උපායඥාන දායාද කර තිබේ.

පිරිමියෙකු සතු ප්‍රජනන ශක්තිය කාන්තාවන්ට වඩා ප්‍රබල තත්ත්වයක තිබීම පුරුෂාධිපත්‍යයට එක් විශේෂ හේතුවකි. සාමාන්‍යයෙන් දරුඵල දැරීමේ කාන්තාව සතු හැකියාව දරුවන් 12 කට පමණ සීමාකළ හැකි මුත්, ජෙංගිස්ඛාන් වැන්නවුන්ගේ ක්‍රියා කලාපය විමසන්නෙකුට පුරුෂයකු සතු ප්‍රජනන ශක්තිය අධික බැව් සිතාගත හැකිය. කාන්තා ජනගහනයෙන් 50 % ක්, පිරිමින් 10% කගේ ඒකාධිකාරියට නතු වුවහොත් ඉතිරි පිරිමි ජනගහනයට දරුවන් ලැබීමේ හැකියාව බෙහෙවින් හීන වෙතැයි කැම්බල් පවසයි.

අධික කායශක්තියෙන් යුත් අතීත මිනිසාගේ ජාන අපට මුසුවී ඇත.

මින් වසර 800 කට පෙරවූ ජෙංගිස්ඛාන්ගේ යුගය මෙන් නොව අද ඒකභාර්‍යාචාරිත්‍රය සහ විවිධ උපත්පාලන ක්‍රම භාවිතය ප්‍රජනනය සීමාවීමට පාදක වී ඇත. එහෙත් සම්පත් සහ බලය හිමි පුද්ගලයෝ අදත් වැඩි වැඩියෙන් ලිංගික සම්බන්ධකම් පවත්වති.

පසුගිය අඩ සියවස තුළ ලිංගික තෘප්තිය විෂයෙහි ලා ගැහැනිය දක්වන මනාපයන් පිළිබඳව මේ වන විට දත්ත සම්භාරයක් පර්යේෂණ ඇසුරින් එක්රැස්කොට ඇත.

හූරාකන සමාජ සංස්ථාව අධ්‍යයනය කල පර්යේෂකයෝ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ රසායනාගාර පර්යේෂණ යනාදියේ අනුසාරයෙන් ගැහැනිය ලිංගික තෘප්තිය සඳහා වැඩිමනාපයක් දක්වනුයේ පුරුෂයකුගේ බාහිර පෙනුම හා ගති ලක්ෂණවලටත් වඩා මුදලට බැව් ප්‍රකාශ කර සිටිති. ගැහැනියකගේ ලිංගික ප්‍රවණතාවත් මුදලේ බලයට නැමෙන බැව් පර්යේෂකයෝ තවදුරටත් පවසති.

අනෙක් අයට ආධිපත්‍යය හෝ උසස් සමාජ තත්ත්වයක් නොමැතිවීම පුද්ගලයාට හිතකර නොවේ. මෙතෙක් කරන ලද අධ්‍යයනවලින් හෙළිවී ඇත්තේ පිරිමියාගේ මානසික ආතතියට ජයග්‍රහණය, බලය සහ තරගකාරිත්වය වැනි සාධක මුල් වී ඇති බවෙකි.අනපේක්ෂිතව රැකියාව අහිමි වීම නිසා පිරිමියාට තම යෝජිත විවාහය අඩාල වීම, ස්වකීය ගෞරවයට හානි සිදුවීම වැනි භයානක ප්‍රතිඵල ඇතිවිය හැකිය.

අඩු සමාජීය සහ ආර්ථික මට්ටම හේතු කොටගෙන විවිධ රෝගාබාධ වලට පිරිමින්ට මුහුණ පෑමට සිදුවෙතැයි ස්ටැන්පර්සි හී ජීව විද්‍යාඥ රොබර්ට් සැපෙල්ස්කි පවසයි.සමාජයේ පහත් තලයකට තල්ලුවීම නිසා රුධිර පීඩනය, ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය හීනවීම සහ හදවතට හානි සිදුවියහැකි යයි සතුන් සම්බන්ධයෙන් පවත්වන ලද අධ්‍යයනයකින් හෙළිවී ඇත.

සාමය යුක්තිය හෝ සන්තුෂ්ටිය වැනිදේ පිළිබඳව අද වැනි සංකීර්ණ යුගයක අපේක්ෂා තැබිය හැකිද යන්න ගැටලුවකි. එහෙත් තත්ත්වය ඒ තරම්ම අශුභදායක නැත.

අඩු සමාජ මට්ටමක ගතකරන ජීවිතය එතරම් සැපටත් නොවුවද, එය සර්වසම්පූර්ණ වනුයේ සමාජයේ ඉහළම ස්ථාවරයේ පමණක් යයි සිතිය නොහැකිය. අඩු සමාජ මට්ටමක සිට ඉහළ සමාජ ස්ථීරයකට පිවිසීම අපේ පරාසය ඉතා වැදගත්. දහවල් කාලයේ දී ගේ දෙර බලාගැනීම වැනි රැකියාවක නිරත පුද්ගලයෙකු රාත්‍රී කාලයේ දී ආත්මාරක්ෂක උපදේශකයකු වැනි ඉහළ මට්ටමක රැකියාවක් කරනු ඇත. කෙසේවුවද, උසස් සමාජ මට්ටමක වැජඹීම බලය සහ මුදල මත පමණක් රඳා නොතිබීම සාධනීය වර්ධනයකි. ක්ෂීරපායි වර්ගයේ සතුන් අතරද,

නව වර්ගයාට ලෙන්ගතුකමක් පානු ලබන නායකයින්ට වැඩිකලක් තම අනසක පවත්වාගෙන යාමට හැකි වෙතැයි පැවසේ.ජනතා හිතකාමී නායකයින්ගේ පැවැත්ම වඩාත් සුරක්ෂිතය.

විද්‍යාඥ මතය අනුව ඔවුන්ගේ ටෙස්ටස්ටෙරෝන් ක්‍රියාකාරිත්වය , ආවේග පාලනය කරනු ලබන සෙරොටොනික් විසින් ප්‍රමාණවත් අයුරින් පාලනය කරනු ලබයි.ආධිපත්‍යය, බලය සහ උසස් සමාජ තත්ත්වය සතු ගුණාත්මක භාවය එකී යහපත් කළමනාකාරිත්වය මත රැඳෙනු ඇත. ❑

**ආධිපත්‍ය සඳහා පිරිමි චිම්පන්සිහු අති විශේෂ උනන්දුවක් දක්වයි.එමෝරි විශ්ව විද්‍යාලයයේ චයසිාවේද විද්‍යාඥයෙකුවූ ෆ්‍රාන්ස් ඩී වාල් කියයි. ඔවුහු නිරන්තරයෙන්ම ආධිපත්‍ය නොවීම සඳහා සටන් වදිති. චිම්පන්සිහුද පිරිමින් මෙන් බොරුවෙන් රැවටීමට, කපටිකම්වලට සහ සමහර අවස්ථාවල දී තම රැලේ එකකු මරාදැමීමටද පසුබට නොවෙති**

**කේ.ඩී.එම්.කිත්තම්පහුව**